# පොම්පෙඕ ලේකම්තුමා සමග දෙරණ නාලිකාව පැවැත්වූ සම්මුඛ සාකච්ඡාව

**ප්‍රශ්නය:** කොළඹ නගරයේදී මෙසේ අප සමගින් කථා කිරීමට ඔබේ කාලය වෙන්කිරීම පිළිබඳව ස්තුතියි පොම්පෙඕ ලේකම්තුමනි. ඔබ මෙහි පැමිණීම ඉතා තීරණාත්මක බවක් පැවසෙනවා. එය කලාතුරකින් සිදුවන දෙයක් වශයෙන් සහ මෙම සංචාරය සිදුකෙරෙන කාල වකවානුව අනුව විශේෂ වන බවක් සඳහන් වනවා. මේ අවස්ථාවේදී ඔබට සන්නිවේදනය කරන්නට තිබුණු වැදගත් කරුණ කුමක්ද?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔබ සමගින් සම්බන්ධ වන්නට ලැබුණු අවස්ථාවට ස්තුතියි. මා එය අගය කරනවා. කොළඹ නගරයට පැමිණෙන්නට ලැබීම ඉතා විශිෂ්ටයි.

බලන්න- මා බහුල වශයෙන් මේ කලාපයට පැමිණෙනවා. මා මීට කලින් මෙහි පැමිණීමට නියම කරගෙනයි සිටියේ. ලෝකයේ වූ සිදුවීම් සමගින් මට එම ගමන මදක් පමා කරන්නට සිදුවුනා. ඉතින් මට මෙහි පැමිණෙන්නට හැකි වූයේ මේ අවස්ථාවේ තමයි. මෙහි පැමිණීම ගැන මා සිටින්නේ ඉතාමත් සන්තෝෂයෙන්. මෙය, මේ කලාපයේ ඉතිහාසයෙහි වැදගත් කාලවකවානුවක් වනවා. ශ්‍රී ලංකාවේ තිබෙන්නාක් වැනි, සහ එක්සත් ජනපදයේ තිබෙන්නාක් වැනි, අද්විතීය ප්‍රජාතන්ත්‍රවාද තුළ, ජීවිතය මෙහෙයවිය යුත්තේ කෙසේද යන්න සහ ස්වෛරී රටවල් පැවතීම හා තමන්ට අවශ්‍ය කරන ජීවිතය ගත කිරීමට අවස්ථාව සහිත නිදහස් ජනතාවන් සිටීම සම්බන්ධයෙන් පොදු දැක්මක් තිබෙනවා.

ඒ පණිවුඩය බෙදාහදාගැනීමටත් ශ්‍රී ලංකාවේ ස්වෛරීත්වය පිළිගැනීම සඳහා අපට කළහැකි සියල්ල කිරීමට එක්සත් ජනපදය සූදානම් බව දැනුවත් කිරීමටත් මෙහි පැමිණීමට මට අවශ්‍ය වූවා. එමෙන්ම, එක්සත් ජනපදය කියන්නේ මිතුරකු හා හවුල්කරුවකු වන බවත්, ලෝකය කෙසේ ක්‍රියාත්මක වියයුතුද යන්න පිළිබඳව පොදු දැක්මක් ඇති ප්‍රජාතන්ත්‍රවාදයක් වන බවත් ශ්‍රී ලංකාවේ ජනතාවට වැටහෙන බව සහතික කරගැනීමට යි.

**ප්‍රශ්නය:** ශ්‍රී ලංකාවට සිදුකළ මේ ඉතා වැදගත් සංචාරය සහ, එක්සත් ජනපදය සමගින් සම්බන්ධතා වැඩිදියුණු කරගැනීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ විදේශ අමාත්‍යාංශය පලකළ අදහස් සලකා බලන කල, ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය අතරේ අනාගත සබඳතා කුමන ආකාර වේද?

**පොම්පෙඕ ලේකම්තුමා:** මෙය ඉතාම හොඳ සංචාරයක් වූවා. ජනාධිපතිතුමා සමගින් පැවැත්වූ සහ විදේශ ඇමතිතුමාත් එතුමාගේ කණ්ඩායමත් සමගින් පැවැත්වූ රැස්වීම් හොඳින් සිදුවූවා. අපට කළහැකි දේවල් සහ අවස්ථාවන් බොහෝමයක් තිබෙනවා. ඇමරිකානු පෞද්ගලික ව්‍යාපාර මෙරට ආයෝජන සිදුකිරීම සම්බන්ධයෙන් අප බොහෝ කථාබහ කළා, දැනටමත් මෙහි පැමිණ සිටින සමාගම් තව තවත් වැඩිපුර මෙහි ආයෝජන කිරීම සම්බන්ධයෙන් පමණක් නොව කෘෂිකර්මාන්ත හා පුනර්ජනනීය බලශක්ති හා තාක්ෂණ ක්ෂේත්‍රවල අළුත් අවස්ථා පිළිබඳව ද කථා කළා. ශ්‍රී ලංකා ජනතාවට බොහෝ අවස්ථා ඒවායෙහි තිබෙනවා.

මෙතැනදී ශ්‍රී ලංකාවත් තමන්ගේ කොටස ඉටුකරන්නට අවශ්‍යයි. ආයෝජන පිළිගන්නාසුළු රටක් වීමට අවශ්‍යයි. ඇමරිකානු ආයෝජකයින්ට මෙහි පැමිණීමට උනන්දුව ඇතිකෙරෙන අන්දමින් මෙරට නීතියේ පාලනය සහ විනිවිදභාවය තිබිය යුතු යි. නමුත්, මේ සම්බන්ධයෙන් සාර්ථක ප්‍රතිඵල ලබාගන්නට අපට හැකිවෙතැයි මට විශ්වාසයි. අප එසේ කළ විට, මෙරටට පැමිණෙන ඇමරිකානු සමාගම්වලට එය හොඳ තත්වයක් වේවි, ඊටත් වඩා, ශ්‍රී ලංකාවේ ජනතාවට එය ඉතාමත් හොඳ තත්වයක් වේවි. රැකියාවන්, අවස්ථා සහ ධනය උත්පාදනය පමණක් නොව, ආඥාදායක පාලනතන්ත්‍රවලට කළ නොහැකි, එහෙත් ප්‍රජාතන්ත්‍රවාද සහ පෞද්ගලික අංශයට සාක්ෂාත් කරදිය හැකි තත්වයන් එතුළින් නිර්මාණය වේවි.

**ප්‍රශ්නය:** ඒවාගේම ලේකම්තුමනි, මෑතකදී නියෝජ්‍ය සහකාර ලේකම් තොම්සන් මහතා දීර්ඝ කාලීන සමෘද්ධිමත්භාවය සඳහා ශ්‍රී ලංකාවේ ආර්ථික ස්වාධීනත්වය ආරක්ෂා කරගැනීමට, දුෂ්කර එහෙත් අවශ්‍ය කරන තීරණ ගන්නා මෙන් ශ්‍රී ලංකාව උනන්දු කරවමින් අදහස් පලකර තිබුණා. ශ්‍රී ලංකාවේ විශාලතම වෙළඳ හවුල්කරු

වශයෙන්  එක්සත් ජනපදය ශ්‍රී ලංකාව විසින් ගනු ඇතැයි අපේක්ෂා කරන මේ දුෂ්කර තීරණ හෝ තේරීම් හරියටම කියනවානම්, මොනවාද?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔව්, ශ්‍රී ලංකාව කළයුතු දේ මොනවාදැයි මා හරියටම දන්නවා, නමුත් ඊට වඩා වැදගත් වශයෙන්, ශ්‍රී ලංකාවේ ජනතාවත් ශ්‍රී ලංකා නායකත්වයත් එය දන්නවා.  මෙය, එක්සත් ජනපදය විසින් තමන්ගේ දැක්ම ශ්‍රී ලංකාව මත පැටවීමක් නොවේ, ඇත්තෙන්ම ඊට හාත්පසින්ම වෙනස් දෙයක්. සිදුවන්නේ, මෙහි සිටින ශ්‍රී ලාංකික ජනතාවගේ ජීවිත වඩාත් යහපත් කිරීම සඳහා අපට කළහැකි දෑ ශ්‍රී ලංකාව විසින් ඇමරිකාව සමගින් බෙදාහදාගැනීමයි. ශ්‍රී ලංකා රජය විසින් සිදු කරනු ඇතැයි අප බලාපොරොත්තුවන තේරීම් මේවායි. එසේ කළ විට, අවස්ථාවන් උදාවේවි, එක්සත් ජනපදය සමගින් පමණක් නොව කලාපයේ අනෙකුත් ප්‍රජාතන්ත්‍රවාදයන් සමගිනුත් හොඳ හවුල්කාරීත්වයන් තිබේවි.

මා මෙහි පැමිණියේ ඉන්දියාවේ සිටයි. මෙහි සිට මීළඟට මා මාලදිවයින් කරා ගමන් කරනවා. රාජ්‍ය ලේකම් ධුරයේ ගතකරන මාගේ කාලයෙන් සැහෙන තරමක් මා ආසියාවේ සහ ගිනිකොණදිග ආසියාවේ ගතකර තිබෙනවා. දකුණු කොරියාව හෝ ඔස්ට්‍රේලියාව හෝ ජපානය වේවා,  මේ ප්‍රජාතන්ත්‍රවාදී රටවලට එක්ව වැඩ කිරීම සඳහා අවස්ථාව තිබෙනවා. එනිසා, එහි කොටස්කරුවකු වන්නට, එනම්, අනාගතය සඳහා සැබෑ අවස්ථා සහ සැබෑ ස්වෛරීත්වය සාක්ෂාත්කරගැනීමේ කොටස්කරුවකු වන්නට ශ්‍රී ලංකාවට අවශ්‍ය වනු ඇතැයි  ද මට විශ්වාසයි.

වෙනත් රටවල් පැමිණ විශාල ණය ප්‍රමාණයක් හරහා රටට අතිවිශාල බරක් පැටවීමක් සිදුවන ඉතිහාසයක් වෙනුවට, ශ්‍රී ලංකාවේ ජනතාවට ඔවුන්ගේ ජීවිත වඩාත් යහපත් කරනු ඇත්තේ මේවා හරහායි. එසේම, ඔවුන් පැමිණෙන්නේ පෞද්ගලික අංශය සමගින් ද නොවන අතර ඔවුන් ශ්‍රී ලාංකිකයින් සේවයට බඳවාගැනීම සිදුකරන්නේ ද නැහැ. එක්සත් ජනපදය ඇතුළු ප්‍රජාතන්ත්‍රවාදී රටවල්වලට ඇත්තේ ඊට වඩා වෙනස් දැක්මක්. අද දිනයේ පැවැත්වූ හමුවීම් හරහා, එකී පොදු දැක්ම සම්බන්ධයෙන් ළඟින්ම වැඩ කිරීමට අපට හැකිවේය යන්න පිළිබඳව සැබෑ බලාපොරොත්තු මා තුළ ඇති කළා.

**ප්‍රශ්නය:** ඉන් අදහස් කෙරෙන්නේ, මධ්‍යස්ථ රටක් වශයෙන් සිටීමටත් භූදේශපාලනික බල ක්‍රීඩාවක නොපැටලී සිටීමටත් ශ්‍රී ලංකාවේ කැමැත්තට එක්සත් ජනපදය ගරුකරන බවද?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඇත්තෙන්ම එය තේරීම් පිළිබඳ කාරණයක්. සෑම රටක්ම තේරීම් සිදුකරනවා. එම තේරීම් නම්: ඔබට ප්‍රජාතන්ත්‍රවාදයක් සහ නිදහස අවශ්‍ය ද? යන්නයි. ශ්‍රී ලංකාවේ නායකත්වයට අවශ්‍ය වී ඇත්තේ හරියටම එය බව මට විශ්වාසයි. එසේම, ඔබ ඒවා තෝරාගත් කළ, ඔබට වෙනස් අන්දමක හවුල්කරුවන් ලැබෙනවා. ස්වෛරී රාජ්‍යයක් වශයෙන් ශ්‍රී ලංකාව ගන්නා තීන්දු තීරණවලට සැබැවින්ම ගරුකරන හවුල්කරුවන් ඔබට ලැබෙනවා. ආරක්ෂක සහයෝගීතාවය අවශ්‍ය වූ අවස්ථාවල- ඔබට මත්ද්‍රව්‍ය විරෝධී මෙහෙයුම් ඉතා හොඳින් සිදුකිරීමට හැකියාව ලැබෙන පරිදි අප වෙරළාරක්ෂක නෞකා දෙකක් ලබා දී තිබෙනවා. එමෙන්ම අප මෙහි පෙනී සිට, ශ්‍රී ලංකාව තුළ ත්‍රස්තවාදී අවදානම අඩුවන බව සහතික කරගැනීමේ කටයුතු සඳහා උදවු වනවා.

ප්‍රජාතන්ත්‍රවාදී රටවලට එක්වී වැඩකළ හැක්කේ මෙවැනි දෑ සම්බන්ධයෙනුයි.  අපට පොදු දැක්මක් සහ පොදු අරමුණක් තිබෙනවා. අප දෙරටටම යහපතක් වන ඉතා සමීප, ඉතාමත් ගතික හා බලවත් සම්බන්ධතාවයක් සහිත තැනකට ශ්‍රී ලංකා ජනතාව පැමිණෙතැයි මට බලවත් විශ්වාසයක් තිබෙනවා.

**ප්‍රශ්නය:** එම්සීසී ගිවිසුම ගැන කථා කරනවිට, ශ්‍රී ලංකාව දෙවරක්ම නියමිත දිනවකවානු ඉක්මවා ගොස් තිබෙනවා. එක්සත් ජනපදය තවමත් මේ පිළිබඳව කථා කරමින් සිටිනවා. එම්සීසී ගිවිසුමට අත්සන් තැබීම ශ්‍රී ලංකා රජයට දේශපාලනික වශයෙන් අභියෝගකාරී වුවහොත් කුමක් සිදුවනු ඇත්ද?

**පොම්පෙඕ ලේකම්තුමා: ඔව්,** ඉදිරිපත් කරනු ලැබූ බොහෝ දේවල් අතරින්, එය එකක් පමණයි. ශ්‍රී ලංකාව සඳහා එය තේරුමක් නොවේ නම්, ශ්‍රී ලංකාව එය පිළිගනීමෙන් වැලකී සිටීවි. අප අතර ඇති මේ සම්බන්ධතාවය සහ එහි විවිධ පැතිකඩ, මේ එක් ගනුදෙනුවක් හෝ එක් අවස්ථාවක් සැහෙන තරමකින් ඉක්මවා යන ගැඹුරකින් සහ

සංකීර්ණත්වයකින් යුක්තයි. තවත් බොහෝ දේවල් තිබේවි. ශ්‍රී ලංකා රජය සමගින් අපි ඒවා සම්බන්ධයෙන් සමීපයෙන් වැඩ කරනු ඇති.

**ප්‍රශ්නය:** වගවීම සම්බන්ධයෙන් ඔබතුමා ඒකාබද්ධ මාධ්‍ය හමුවේදී ත් සඳහන් කළා.  වගවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවට ඇති බැඳීම් හා අදාළව කටයුතු කිරීමටත්, එක්සත් ජනපදයට පැමිණීම තහනම් කර ඇති ශ්‍රී ලංකාවේ හමුදාපති ලුතිනන් ජෙනරාල් ශවේන්ද්‍ර සිල්වා මහතා සම්බන්ධයෙනුත් එක්සත් ජනපදය ශ්‍රී ලංකාව සමගින් වැඩ කරනු ඇත්තේ කුමන අන්දමින්ද? මේ කරුණු සාකච්ඡාවට භාජනය වනු ලැබුවාද?

**පොම්පෙඕ ලේකම්තුමා:** ඔව්, අද අප මේ සියල්ල ගැන කථා කළා. එක්සත් ජනපදයේ අපට නීතියෙන් නියම කළ කරුණු මාලාවක් තිබෙනවා. අප ඒවා එක හා සමාන අන්දමින් සියළුදෙනාට අදාළ කරගන්නවා. එහිදී කරුණු සියල්ල නිවැරදිව දැනගැනීමට අප උත්සාහ කරනවා. සෑම සිදුවීමක් සම්බන්ධයෙන්ම අප එසේ කරනවා. වගවීම සම්බන්ධයෙන් ගතහොත්, මා මේ සම්බන්ධයෙන් ජනාධිපතිතුමා සමගින් කථා කළා. මා විදේශ ඇමතිතුමා සමගත් කථා කළා; ශ්‍රී ලංකාවේ ජනතාවට වගවීම හා යුක්තිය අවශ්‍ය බවත් ඒවා සාක්ෂාත් කරදීමට මේ නායකයින් අරමුණු කරගෙන සිටින බවත් මට විස්වාසයි. අවසානයේ අපට හැකි ස්ථානවල අපි උදවු කරනවා. අපට යම් තාක්ෂණික සහයක් ලබාදෙන්නට පුළුවන්. ප්‍රතිසන්ධානය හා වගවීම සම්බන්ධයෙන් වන මේ අදහස් සපුරාලීමේදී ජාත්‍යන්තරය ඉදිරියේ ඔවුන් සමගින් එක්ව වැඩ කිරීමටත් අපට පැහැදිලිවම පුළුවනි, එහෙත් අවසානයේදී මේ සම්බන්ධයෙන් ක්‍රියාකළයුතු වන්නේ ශ්‍රී ලංකාවේ නායකත්වය සහ ශ්‍රී ලංකාවේ ජනතාවයි.

මෙය වැදගත් කාරණාවක්. ඔබේ රට මෙය නිවැරදිව කරාවි කියා අප බලාපොරොත්තු වනවා. අනාගතය දෙසට නෙත් යොමු කරමින්, අනාගතයේ සිදුවිය හැකි සියළුම යහපත් දෑ වෙත නෙත් යොමු කරමින් ම, උචිත අන්දමකින් ශ්‍රී ලංකා ඉතිහාසයේ එම කොටස සම්බන්ධයෙන් කටයුතු කිරීමටත් සැබැවින්ම සිදුවූයේ කුමක්ද යන්න පිළිගැනීමට ලක් කිරීමටත් ක්‍රියා කරන බව සහතික කරගැනීම, කළයුතු නිවැරදි දෙය වනවා.

**ප්‍රශ්නය:** අවසාන ප්‍රශ්නය වශයෙන් ලේකම්තුමනි, චීනය ශ්‍රී ලංකාව තුළ වැඩි කාර්යභාරයක් ඉටුකරමින් සිටිනවා, ඉන්දියාවත් එසේමයි, එක්සත් ජනපදයත් SOFA සහ MCC ලබාදීමට ඉදිරිපත් වී සිටිනවා. මීට අමතරව ලබාදීම සඳහා ඉදිරිපත් කරන දෑ මොනවාද?

**පොම්පෙඕ ලේකම්තුමා:** සෑමවිටකම පාහේ ඇමරිකාවෙන් ලබාදීමට ඉදිරිපත් වන්නේ සමාගම් හා පෞද්ගලික ආයෝජන, හවුල්කාරීත්ව සහ මිත්‍රත්වය යි. එක්සත් ජනපදයේ අපි වැඩ කරන්නේ ඒ අන්දමටයි. අප රාජ්‍ය-අනුග්‍රාහකත්වය සහිත ව්‍යාපාර රැගෙන පැමිණෙන්නේ නැහැ. රටකට කිසිසේත්ම ආපසු ගෙවාගැනීමට නොහැකි ණය පැකේජ රැගෙන අපි පැමිණෙන්නේ නැහැ. ඉන්පසුව, රජය ලවා යම් ක්‍රියාවන් කරවාගැනීමට එම ණය අනිසි ලෙස යොදාගන්නට අප උත්සාහ කරන්නේ  නැහැ.

නැහැ, අපට අවශ්‍ය වන්නේ ශ්‍රී ලංකා ජනතාවට අවශ්‍ය වන දෙයමයි: එනම්, දියුණු වීම සඳහා ඉඩක්, සැබෑ අවස්ථා ලබාගැනීමට ඉඩක්, ලෝකය වටා ගොස් එක් එක් තැනැත්තාට සහ ඔවුන්ගේ පවුලේ අයට වඩාත් හොඳ ජීවිතයක් සාක්ෂාත් කරගැනීමේ ඉඩක්. මේ, එකිනෙකට ඉතාමත් වෙනස් ආකෘති දෙකක් වනවා. එකක්, ප්‍රජාතන්ත්‍රවාදය හා නිදහස සඳහා වන ආකෘතියක්.  අනෙක, ඒකාධිපතිවාදී හා ආඥාදායක ආකෘතියක්. ශ්‍රී ලංකාවේ ජනතාව තමන් වෙනුවෙන් නිවැරදි තේරීම සිදුකරාවි යැයි අපට ඒත්තු ගොස් තිබෙනවා. ඉතාමත් දීර්ඝ කාලයක පටන් මෙරට සිදුවී ඇත්තේ එයයි. මෙරට, ආසියාවේ පැරණිතම ප්‍රජාතන්ත්‍රවාදය වන බව විදේශ ඇමතිතුමා මට සිහිපත් කළා. එම සම්ප්‍රදාය වැදගත් හා බලවත් වනු ඇති බවත්, එක්සත් ජනපදය හා ශ්‍රී ලංකාව අතර වඩ වඩාත් යහපත් සම්බන්ධතාවයක් එහි අර්ථය වනු ඇති බවත් මට විශ්වාසයි.

**ප්‍රශ්නය:** ඔබතුමාගේ කාලය වෙනුවෙන් බොහෝම ස්තුතියි

**පොම්පෙඕ ලේකම්තුමා:**  ස්තුති මහත්මිය, මා සම්බන්ධ කරගැනීම පිළිබඳව ස්තුතියි.

**ප්‍රශ්නය:** අද දෙරණ 24 - හයිඩ් පාක් වැඩසටහනට අප සමගින් සම්බන්ධ වූයේ රාජ්‍ය ලේකම්තුමා වන මයික් පොම්පෙඕ මහතායි.